## ශීර්ෂය 16 - පාර්ලිමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 16 - පාර්ලිමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව ජුනි 06 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව අගෝස්තු 06 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023.11.30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය ප්‍රකාරව ජයන්තිපුර පිහිටි ඉඩම සහ එහි පොලිස් සේවා වනිතා ඒකකය විසින් රු.මිලියන 7.8 ක් වැයකර ඉදිකර තිබූ ආපන ශාලාව සහ අනෙකුත් ගොඩනැගිලිවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක : SA/GFS/01/01/11/016 හා 2024.05.09 දිනැති ලිපිය මගින් ජයන්තිපුර පිහිටි ගොඩනැගිලි සහ ඉඩම් වල තක්සේරු වටිනාකම ලැබී ඇති අතර 2024 වර්ෂය තුලදීද පොලිස් සේවා වනිතා ඒකකය විසින් රු.මිලියන 7.8 ක් වැය කර ඉදිකර ඇති ගොඩනැගිලිවල මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කළ යුතු වටිනාකම කුමක්ද යන්න තීරණය කර ඒ අනුව ද ගිණුම්ගත කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | යොමුගත මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී විදේශ ප්‍රදාන ලෙස ලැබී තිබූ භාණ්ඩවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීමද සිදුකර නොතිබුණි. | විදේශ ප්‍රදාන ලෙස ලැබුණු භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීමට කමිටුවක් දැනටමත් පත් කර ඇති අතර එම කමිටු වාර්තාව අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වටිනාකම නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් **'බී'** ගිණුමට අදාල දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු.43,051 ක වෙනසක් විය. | 2021 වර්ෂයේදී විශාල පරිශ්‍රමයකින් අනතුරුව වෙනස රු.43,051 ක් දක්වා අඩුකර ගැනීමට හැකි වූ අතර තවදුරටත් වෙනස හඳුනාගැනීම සඳහා මෙම වෙනස හඳුනාගැනීම සඳහා කටයුතු කරන අතර එසේ නොහැකි නම් අනුව මෙම වෙනස සොයා ගත නොහැකි නම් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් මඟින් මේ සම්බන්ධව උපදෙස් ලබාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | වෙනස හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

### 2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 සහ මුදල් රෙගුලාසි 127(5) ප්‍රකාරව කටයුතු කල යුතු වුවද මූලික ඇස්තමේන්තු සැකසීමේදී අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් 08 ක එකතුව රු. 200,800,000 ක් වූ සියයට 3 සිට සියයට 76 දක්වා පරාසයක ප්‍රතිපාදන මු.රෙ.66 මඟින් වෙනත් පුනරාවර්තන වැය විෂයන් 06 කට සහ එක් මූලධන වැය විෂයයකට මාරු කර තිබුණි. | විදුලි හා ජල බිල්පත් ගාස්තු වැඩි වීම, ලංකා විදුලි බල මණ්ඩලය හා ජල සම්පාදන මණ්ඩලය අය කරන නඩත්තු ගාස්තු වැඩි කිරීම, වැට් බදු වැඩි වීම හා බාහිර සේවා හා සැපයුම් සපයන ආයතනවල ගාස්තු වැඩි වීම වැනි හේතු නිසා පාර්ලිමේන්තුවේ කටයුතු සුමටව පවත්වාගෙන යාමට ඇතැම් වැය විෂයන් යටතේ වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා ප්‍රතිපාදන මාරුකර ගැනීම් සිදු කරන ලද අතර එසේ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කළ වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වීමට හෝ ඌනතාවයන් ඇති වීමට බලපෑ හේතු අදාළ මාරු පත්‍රවල වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැරකම් හා බැඳීම් ප්‍රකාශයේ (භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත - SA 92) හා ආයතනයේ බැරකම් පිළිබඳ ලේඛනයේ ඇතුලත් කර නොතිබුණු සමාලෝචිත වර්ෂයට අදාල වැය විෂයයන් දෙකක එකතුව රු.24,266,808 ක් වූ බැරකම් 2024 වර්ෂයේ දී ගෙවා තිබුණි. | 2023 වර්ෂයෙහි භාණ්ඩ හා සේවා වලට අදාළ වැට් බදු ඉහළ යාම, ලංකා විදුලි බල මණ්ඩලය හා ජල සම්පාදන මණ්ඩලයේ බිල්පත් ගාස්තු වැඩි වීම වැනි අපගේ පාලනයෙන් බැහැර තත්වයන් නිසා ප්‍රතිපාදන ඌනතාවයන් ඇති වූ අතර ප්‍රතිපාදන නොමැතිව බැරකම් සිගාස් මෘදුකාංගයට ඇතුළත් කිරීමට නොහැකි වීම නිසා මෙම අඩුපාඩුව සිදු වී ඇති අතර 2024 වර්ෂයේදී එම තත්ත්වයන් අවම කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | අදාල බැරකම් හා බැඳීම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු අතර ප්‍රතිපාදන ඉක්මවා බැඳීම්වලට එළඹීම සිදු නොකළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | **ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | මුදල් රෙගුලාසි 260 | 81,469,324 | 2023 ජනවාරි සිට ජූලි දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා ගෙවන ලද එකතුව රු.81,469,324 ක් වූ වවුචර්පත් 122 ක ගෙවීම් ලබා ගත් තැනැත්තාගෙන් ගෙවීම ලබාගත් බවට තහවුරුවක් ලබා ගෙන නොතිබුණි. | වවුචර්පත්වල චෙක්පත් භාරගත් බවට අත්සන් තබා නොමැතිනම් එම අඩුපාඩු ඇති නොවන පරිදි ඉදිරියේදී කටයුතු කරන ලෙස අවශ්‍ය උපදෙස් දී ඇති බව දක්වා ඇත. | ගෙවීම් කිරීමේදී නියමිත තැනැත්තාටම මුදල් ගෙවූ බවට තහවුරුවක් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ ඡේද අංක 6.2 | අදාල තැන්පතු අංක පමණක් යොදා ගෙන ආකෘතිය සංශෝධනය කර ගත යුතු වුවත්, පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 4 ආකෘතිය එසේ සංශෝධනය කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ඒසීඒ 4 ආකෘතියෙහි අවශ්‍ය සංශෝධන සිදු කිරීමට සටහන් කර ගත් බව දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීමේ දී එක් මාණ්ඩලික නිලධාරියෙකුට පමණක් අත්තිකාරම් ලබා දී තිබූ අතර අවස්ථා 10 ක දී මුලින් ලබා ගත් අත්තිකාරම පියවීමට පෙර නැවත අත්තිකාරමක් ලබා දී තිබුණි. තවද, 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 (ආ) ඡේදය ප්‍රකාරව එක් අවස්ථාවක දී රු. 100,000 ක උපරිමයක් දක්වා තත්ත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවත්, මුලින් ලබා දී තිබූ අත්තිකාරම පියවීමට පෙර තවත් අත්තිකාරමක් ලබාදීම නිසා අවස්ථා 2 කදී අත්තිකාරම් ලබාගත් නිලධාරී වෙත රු.187,644 ක හා රු.117,150 ක මුදලක් රැඳී තිබුණි. | පාර්ලිමේන්තුවේ දෛනික කටයුතු වලදී, එක් එක් දෙපාර්තමේන්තු වල බොහෝ කාර්යයන් සඳහා අවශ්‍ය මිලදී ගැනීම් සම්බන්ධ ඉල්ලීම් ඉටු කරනු ලබන්නේ සැපයුම් හා සේවා කාර්යාලය මඟින් වන අතර අවශ්‍ය අත්තිකාරම් ඉල්ලා සිටිනු ලබන්නේ සැපයුම් හා සේවා කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) විසිනි. ඒ අනුව එක් එක් අවශ්‍යතාවය සඳහා වෙන වෙනම අත්තිකාරම් ලබාදීම සිදු කරයි. විවිධ රටවල විදේශ දූත මණ්ඩල, තානාපතිවරු හා රාජ්‍ය නායකයන් ඉතාමත් කෙටි දැනුම් දීමක් තුළ පාර්ලිමේන්තුවට පැමිණෙන බැවින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය සැපයුම් හා සේවා සඳහා ද අත්තිකාරම් ලබා ගැනීමට සිදුවන අතර පෙර ලබා ගත් අත්තිකාරම් මුදලක් පියවීමට පෙර නැවත අත්තිකාරම් මුදල් ලබා ගැනීමට | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සිදු වීම වැළැක්විය නොහැකි බැවින් එවැනි අවස්ථා අවම වන පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | |
| (ආ) | අවශ්‍යතාව පිළිබඳ විධිමත් ඇස්තමේන්තුවක් සකස් කිරීමෙන් තොරව අත්තිකාරම් ගෙවීම නිසා අවස්ථා 9 කදී ලබා දී තිබූ එකතුව රු.197,150 ක් වූ අත්තිකාරම් මුදලින් එකතුව රු. 98,751 ක් එනම් සියයට 31 සිට සියයට 86 දක්වා පරාසයක මුදල් වියදම් නොකර ආපසු පියවා තිබුණි. | ඉදිරියේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371(2) ආ, 371(5) කෙරෙහි අවධානය යොමු කරමින්, අත්තිකාරම් ඉල්ලුම් කිරීමේදී, අදාළ කාර්යය පිළිබඳ දළ ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කළ යුතු බවටත්, අත්තිකාරම් මුදල් උපයෝජනය කිරීමේ පරාසය අවමකර ගැනීමට ද අදාළ නිලධාරින් දැනුවත් කර ඇත. | අවශ්‍යතාව පිළිබඳ විධිමත් ඇස්තමේන්තුවක් සකස් කර අත්තිකාරම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

(අ) **ප්‍රසම්පාදන සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් සහ කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් මස 10 වන දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරීයාගේ අනුමැතිය ලබා ගෙන එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, විගණනයට | 2024 වසර සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම මා වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීම නිසිපරිදි සිදුකළ අතර අදාළ කාල රාමුවට අනුගත වනලෙස හා එම අනුමැතිය සහිත ප්‍රසම්පාදන සැලසුමේ පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කරන ලෙසත් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | අනුමත කළ ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලයේදී විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අනුමත කර නොතිබුණි. | | |
| (ii) | විගණනයට ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් රු.462,037,552 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 53 ක, වර්ෂය අවසානයේ ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එහි ඵලදායීතාවය විගණනයේදී ඇගයීමට ලක් කළ නොහැකි වූ අතර එකතුව රු.191,198,552 ක් වූ නැවත නැවත සිදුකළ යුතු නොවන ප්‍රසම්පාදන කාර්යයන් 25 ක ප්‍රසම්පාදන කාර්යය සම්පූර්ණ කරන දිනය ලෙස 2022 වර්ෂයේ දිනයන් දක්වා තිබුණි. | දත්ත ඇතුළත් කිරීමේදී සිදුවී ඇති ප්‍රමාද දෝෂයන් අනුව එසේ සිදු වී ඇති බැවින් ඒ පිළිබඳව වඩාත් සැලකිලිමත් වන ලෙසද සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රගතිය කාර්ය සාධන වාර්තාවට ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව රු.401,878,857.86 ක වටිනාකමකින් යුතු වැඩ ඉටුකර ඇත. 2024 ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රගතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සකස් කර ඉදිරියේදී ඉදිරිපත් කිරිමට කටයුතු කරන මෙන් අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි. | නිවැරදිව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කළ යුතුය. |

**3.2 කාර්යයභාරයන් ඉටු නොකිරීම.**

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පාර්ලිමේන්තුවේ රැස්වීම් වාර 105 ක් පවත්වා තිබුණු අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 න් 150 කට වඩා අඩුවෙන් සහභාගී වී තිබුණු රැස්වීම් වාර ගණන 24 ක් ද මන්ත්‍රීවරු 150 ත් 200 ත් අතර සංඛ්‍යාවක් සහභාගී වී තිබුණු රැස්වීම් වාර ගණන 78 ක් ද වූ අතර මන්ත්‍රීවරුන් 200 කට වඩා වැඩියෙන් සහභාගී වී තිබු රැස්වීම් වාර ගණන 3 ක් පමණක් විය. | පිළිතුර සමඟ එකඟ වී ඇත. | රැස්වීම් සඳහා සහභාගිත්වය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව පාර්ලිමේන්තු පරිශ්‍රයේ අමාත්‍ය කාමර සඳහා වායු සමීකරණ පද්ධතියක් සපයා සවි කිරීම, පරීක්ෂා කිරීම සහ ආරම්භ කිරීම සඳහා 2021 ඔක්තෝබර් 12 දින වැට් රහිතව රු.20,464,930 ක මුදලකට ටෙන්ඩරය ප්‍රදානය කර තිබූ අතර මාස 3 ක් ඇතුළත වැඩ නිම කර පාර්ලිමේන්තුව වෙත භාර දීමට 2021 ඔක්තෝබර් 26 දින ගිවිසුම් අත්සන් කර තිබුණි . එසේ වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් කාර්යය අතහැරදමා ගොස් තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් මිල වැඩිකර ගැනීමට කරන ලද ඉල්ලීමත් සමඟ දෙපාර්ශවය අතර ඇති වූ නොඑකඟතාවයන් හේතුවෙන් අදාළ කාලපරිච්ඡේදය තුළ එම කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි විය. මුදල් කිසිවක් නිදහස් නොකළද කොන්ත්‍රාත්කරු විසින් පාර්ලිමේන්තු පරිශ්‍රය තුළට රැගෙන ආ භාණ්ඩ තවමත් පරිශ්‍රය තුළ ඇත. කෙසේ වුවද රජයට ආර්ථිකමය වාසියක් ලැබෙන පරිදි නැවත මෙම කොන්ත්‍රාත්තුව සක්‍රිය කිරීමට ඇති හැකියාව සොයා බලන ලෙස අදාළ නිලධාරියට උපදෙස් ලබා දී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂණවලට යටත්ව ජයන්තිපුර සහ පින්නියර පිහිටා ඇති ආරක්ෂක ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිළිවෙලින් රු.37,147,488 ක හා රු.41,759,760 ක ඇස්තමේන්තුගත මුදලකට නාගරික සංවර්ධන අධිකාරියේ සේවය ලබා ගැනීමට 2018 අගෝස්තු 22 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. | 2018 අගෝස්තු මස 22 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂණ වලට යටත්ව ලබාදී තිබූ බව අප විසින් නිරීක්ෂණය කරන ලද නමුත් ඒ වන විටත් නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය මත නාවික හමුදාව සමඟ ගොවිජන මන්දිරය නවීකරණය ඉතා කාර්යක්ෂම ව්‍යාපෘතියක් ලෙස නිම කෙරෙමින් පැවති බැවින් රජයට ආර්ථිකමය වශයෙන් වැඩි වාසියක් අත්කර ගැනීමේ අපේක්ෂාවෙන් එම ක්‍රමවේදයම මෙම ඉදිකිරීම් සඳහාද | මුදල් හා ජනමාධ්‍ය අමාතාංශා නිරීක්ෂණ වලට අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | එසේ වුවද, ජනමාධ්‍ය අමාත්‍යාංශය ලබා දී තිබූ නිරීක්ෂණවල දැක්වෙන පරිදි “ප්‍රතිපත්තිමය වශයෙන් යෝජනාවට එකඟ වුවද, නාගරික සංවර්ධන අධිකාරිය මෙවැනි වැඩ සඳහා විශේෂිත ආයතනයක් නොවන බැවින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීම මඟින් සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගත හැකි බව” සඳහන්ව තිබුණද එසේ සිදු නොකර නාගරික සංවර්ධන අධිකාරිය වෙතම එම කාර්යයන් භාර දී තිබුණි. | අනුගමනය කිරීමට කටයුතු කොට ඇති බව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීම මඟින් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගත හැකිබව අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන්ව තිබූ බවට කර ඇති නිරීක්ෂණය නිවැරදි වේ. | |
| (ආ) | 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද අදාල කාලයේ දී ක්‍රියාත්මක නොකිරීම, ඉදිකිරීම සම්බන්ධයෙන් වූ භූමියේ පස් සමීක්ෂණ වාර්තාවක් ලබා ගෙන ඊට අනුකූලව ඇස්තමේන්තු සකස් නොකිරීම සහ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් බාහිර උපදේශන සේවය ලබා ගත් පාර්ශවයෙන් අවශ්‍ය උපදෙස් නිසියාකාරව නොලැබීම යන හේතු නිසා ජයන්තිපුර හා පින්නියර පිහිටා ඇති ආරක්ෂක ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ පාර්ලිමේන්තු මහජන සනීපාරක්ෂක පද්ධතිය අලුත්වැඩියා කිරීමේ මුලික ඇස්තමේන්තු පිළිවෙලින් රු.30,583,642 කින්, රු.55,381,311 කින් සහ රු. 18,427,968 කින් හෙවත් පිළිවෙලින් සියයට 82 කින්, සියයට 133 කින් සහ සියයට 84 කින් වැඩි වී තිබුණි. | එකඟ වේ. මුල් ඇස්තමේන්තුව හා අවසන් ඇස්තමේන්තුව අතර විගණනය විසින් දක්වා ඇති පිරිවැය වැඩිවීමේ පරාසය නිවැරදි වේ. ගරු කථානායකවරයා විසින් කරන ලද ඉතාම කෙටි දැනුම්දීමකට ඉතා ඉක්මනින් ලබාදුන් ප්‍රතිචාරයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරියට පළමු ඇස්තමේන්තුව සැකසීමේදී පස් සමීක්ෂණ වාර්තාව සලකා බැලීම මඟහැරීගොස් තිබීමත්, මෙම කාලපරාසය තුළ රටතුළ කොවිඩ් වසංගත ව්‍යාප්තියක් පැවතීමත්, වෙළඳපොල තුළ අමුද්‍රව්‍ය පිරිවැය ඉතා ඉහළ අගයකින් වැඩිවීමත්, මෙම ඉදිකිරීම් පමා වීමටත් එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවැය සැලකියයුතු මුදලකින් ඉහළ යාමටත් බලපා ඇත. | සැලසුම් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම නිවැරදිව සිදු කළ යුතු වේ. |
| (ඇ) | 2019 ජුනි 25 දින ලබා ගෙන තිබූ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ආරක්ෂක ගොඩනැගිලිවල | අදාල ආයතනය, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කළ නොහැකි වැඩ ඉටු කිරීම සඳහා ඔවුනගේ නිසි ක්‍රමවේදයට අනුව යොදා ගන්නා | විධිමත් පරිදි අදාළ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ මිනිස් බලය යොදා ගත යුතු වුවත්, ඊට පටහැනිව පින්නියර ආරක්ෂක ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් සේවයේ යොදවා ගෙන තිබුණි. | ලද උප කොන්ත්‍රාත්කරුවෙකු වේ. | |
| (ඇ) | පින්නියර ආරක්ෂක ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් විධිමත් අනුමැතියක් ලබා නොගෙන වෙනත් ආයතන 02 ක සේවය ලබාගෙන තිබුණු අතර ඒ සඳහා එකතුව රු.3,198,400 ක් ගෙවා තිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් සතු නොවූ කුසලතාවයන් බාහිර ආයතන දෙකකින් ඔවුනගේ අනුමත ක්‍රමවේදය යටතේ තෝරාගෙන පාර්ලිමේන්තුවේ සේවයට යොදවා තිබුණි. ඒ සඳහා කරන ලද වටිනාකම විගණනය විසින් නිරීක්ෂණය කර ඇති පරිදි නිවැරදි වේ. | විධිමත් පරිදි අදාළ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඉ) | නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශනය යටතේ සිදුකර තිබූ, විගණනයෙන් පරීක්ෂා කරන ලද ව්‍යාපෘති 3 කට අදාලව එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | ජයන්තිපුර හා පින්නියර ඉදිකිරීම් ව්‍යාපෘති 02 සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හා වෙන් වෙන්ව ගිවිසුම්වලට එළඹ ඇති අතර ඒවායේ පිටපත් විගණනයට ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුන් අතර පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ යෝජිත සමස්ථ වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය තුළ ගිවිසුමක් සකසා ඇතත්, ඒ තුළ ඇතුළත් උප ව්‍යාපෘති සඳහා පිරිවැය ඇස්තමේන්තු වෙන් වෙන් ව හඳුනා ගැනීමේ අවශ්‍යතාවය අප විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇති බැවින් එම ගිවිසුම් ගතවීම ප්‍රමාද වී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | මහජන සනීපාරක්ෂක පද්ධතිය ප්‍රතිසංස්කරණය සිදුකරන කාල සීමාව තුළ පාවිච්චි කිරීම සඳහා 2021 වර්ෂයේදී ජංගම වැසිකිළි 4 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණු අතර ඒ සඳහා මාසිකව රු.60,000 ක් ගෙවිය යුතු විය. 2023 දෙසැම්බර් 31 දින වන විට ගතව තිබූ කාලය මාස 30 | නිරීක්ෂණය සමඟ එකඟ වන බවත් 2021 වසරේ සිටම මෙම ජංගම වැසිකිළි පද්ධතිය ස්ථාපනය කළ අතර එය පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණෙන මහජනතාවගේත්, ආරක්ෂක අංශවලත්, රජයේ නිලධාරීන්ගේත් සැපයුම්කරුවන්ගේත් අවශ්‍යතාවය වෙනුවෙන් | සැළසුම් කළ කාලය තුළ කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක් සඳහා එකතුව රු. 1,800,000 ක් ගෙවා තිබුණි. වර්ෂ දෙකකටත් අධික කාලයක් තුළ ව්‍යාපෘතිය කර ගෙන යාම නිසා මෙම ජංගම වැසිකිළිද (තාවකාලික වැසිකිළි) වර්ෂ 2 කට අධික කාලයක් දක්වා ලබා ගැනීමට සිදු වී තිබුණි. | වෙන්කොට පැවතුණි. | |

## 3.5 වත්කම් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදයේ අනු අංක 06 ප්‍රකාරව යාවත්කාලීනව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර වාර්තාව ඉදිරි වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, පාර්ලිමේන්තුව විසින් ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව වර්ෂ 2 ක කාලපමාවකින් පසු 2023 අප්‍රේල් 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2022 වසර සඳහා භාණ්ඩ සමීක්ෂණය පවත්වා වාර්තා මා වෙත ඉදිරිපත් කළ අතර එහි තීරණ ක්‍රියාත්මක කර අවසන් වූ වහාම ඔබවෙත පිටපත් ලබාදීමට උපදෙස් ලබා දී ඇත. 2023 වසර සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කොට ඇති අතර ඒ අනුව භාණ්ඩ සමීක්ෂණය සති අන්ත දිනයක පවත්වා දින දෙකක් ඇතුළත එය නිම කිරීමට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2017 මැයි 04 දිනැති අංක 02/2017 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සහ 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/පුස/1(2016-සංශෝධිත) දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව, පාඨකයන්ගේ පරිහරණය සඳහා පුස්තකාලවලට අත්පත් කර ගන්නා ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය | රැස්වීම් නොපවත්වන දිනවලදී පවා පුස්තකාලය තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ භාවිතයක් නිරීක්ෂණය වන බැවින්, එහි වාර්ෂිකව සමීක්ෂණයක් පැවැත්වීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇති නමුත් 9 වැනි පාර්ලිමේන්තුව අවසන් වනවිට ලැබෙන කාලපරාසය තුළ පුස්තකාලයේ පොත් සඳහා වාර්ෂික සමීක්ෂණයක් | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතුය. |

| | | |
|---|---|---|
| | හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඇතුළත් පුස්තකාල ද්‍රව්‍ය, සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ අනිවාර්යයෙන් පැවැත්විය යුතු වුවත්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ පුස්තකාලය සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. | පැවැත්වීමට සැලසුම්කොට ඇත. |

## 3.6 කළමණාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 1 ත් 3 ත් අතර අයවිය යුතු ණය ශේෂය රු.230,943 ක් සහ වර්ෂ 7 ඉක්මවූ ණය ශේෂය රු.398,701 ක් වැඩ තහනම් කළ නිලධාරීන් 3 දෙනෙකුට අදාල වූ අතර එම නිලධාරීන් සම්බන්ධයෙන් වූ විමර්ශන හා නිතිමය කටයුතු අවසන් නොවීම නිසා ණය ශේෂ අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | රු.230,942 ක මුදල වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු අතර ඔහුගේ විමර්ශන අවසන් වූ පසුව ණය මුදල සම්බන්ධව තීරණයක් ගැනීමට කටයුතු කරන බව හා වසර 07කට අධික කාලයක් ඉක්මවූ රු.398,701 ක ණය ශේෂ සම්බන්ධයෙන් නීතිමය කටයුතු අවසන් වී නොමැති බැවින් එම මුදල් තවදුරටත් හිඟ ශේෂයක් ලෙස පවතී. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වියළි ආහාර ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී මිල ගණන් කැඳවා අවම මිලක් තෝරා ගැනීම වෙනුවට ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය වෙතින් පමණක් මිල ගණන් කැඳවා වියළි ආහාර මිලදී ගැනීම තුලින් තරඟකාරී අවම මිලක් ලබා ගැනීමට තිබූ අවස්ථාව මඟහැරී තිබුණි. | රජයේ සමුපකාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත්ව ක්‍රියාත්මක වන ආයතනයක් වීමත්, පාර්ලිමේන්තුවේ ගෙවීම් රටාවට අනුකූලතාවය දක්වා තිබීමත් ඔවුන් ඉදිරිපත් කරන මිළ ගණන් වෙළෙඳපොළ මිළ ගණන් හා තරඟකාරී වන නිසාත් දීර්ඝ කාලයක සිට සමුපකාර අලෙවි සංගමයෙන් මිලදී ගැනීම් සිදු කරන ලද නමුත් 2024 වසරේ සිට විගණනය විසින් යෝජනා කර ඇති පරිදි තරඟකාරී වෙළෙඳපොළ තුළට විවෘත කරන ලදි. | ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී මිල ගණන් කැඳවා අවම මිල තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පාර්ලිමේන්තු සංකීර්ණය ඉදිරිපිට පිහිටි වෙළඳකුටි 13 කින් යුත් මහජන ආපන ශාලා සංකීර්ණය පොලිස් සේවා වනිතා ඒකකයට මාසික කුලිය රු.100,000 කට 2023 ජුනි 01 දින සිට 2025 මැයි 31 | මේ වන විට අදාළ බදු ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කොට ඇත. පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණෙන පාසල් ළමුන් මහජනතාවට හා රැස්වීම් දිනවල ගරු මන්ත්‍රීතුමන්ලාගේ ආරක්ෂක නිලධාරීන්ගේ ආහාරපාන සැපයීම | ආයතනය සතු භෞතික සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

දින දක්වා බදු දී තිබුණු අතර 2023 දෙසැම්බර් මාසය වන විටත් ඒ සඳහා අවශ්‍ය බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. තවද, පොලිස් සේවා වනිතා ඒකකය විසින් එම සංකීර්ණයේ පිහිටි වෙළඳ කුටි 09 ක් එක් වෙළඳ කුටියක් මාසිකව රු. 40,000 ක කුළී මුදලකට නැවත තෙවන පාර්ශවයන් වෙත බදු දී තිබීමෙන් පාර්ලිමේන්තුව විසින් ඵලදායී ලෙස භෞතික සම්පත් උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය.

හා අනෙකුත් මූලික පහසුකම් සපයා ගැනීමටත් වාහන ගාල්කර තැබීමටත් පාර්ලිමේන්තුව සතුව පවතින එහි ආරක්ෂාවටද සැලකියයුතු බලපෑමක් ඇති මෙම භූමිය 2011 වසරේ සිට පොලිස් දෙපාර්තමේන්තුවේ සේවා වනිතා ඒකකය මඟින් මෙම භූමියේ මුඛ්‍ය අරමුණ ඉටුකර ගැනීමට පාර්ලිමේන්තුවට වැය බරක් නොවන අයුරින් කටයුතු කරමින් සිටී. කෙසේ වුවද භෞතික සම්පත් උපයෝජනය තවදුරටත් ඵලදායී ආකාරයෙන් කළයුතු බවට විගණනය විසින් නිරීක්ෂණයකොට ඇති බැවින් පවතින ආරක්ෂක තත්ත්වයද සැලකිල්ලට ගෙන නව ප්‍රවේශයක් සිදු කිරීමට නිලධාරීන්හට උපදෙස් ලබාදී ඇත.

## 3.7 නොවිසඳුණු විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020, 2021 සහ 2022 වර්ෂයන්හි විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවල 3.4 සහ 3.5 ඡේදවල දැක්වෙන " 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 1.2 ඡේදය හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පාර්ලිමේන්තු මහලේකම් වෙත නිකුත් කර තිබූ, අංක TIP/SS/01/84 හා 2019 අප්‍රේල් 25 දිනැති ලිපියට අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය වෙත සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ විධිවිධාන සහ උපදෙස්වලට පටහැනිව, "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු පාර්ලිමේන්තු | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා දීර්ඝ කාලයක සිට පවත්වාගෙන ආ සහනදායී පදනම මත මෝටර් රථවාහන බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳව විගණනය විසින් 2019 වසරේදී ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයන් සමග එම ක්‍රමවේදය තාවකාලිකව අත්හිටුවා ඇත. පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් දීර්ඝ කාලයක සිට භුක්ති විඳිමින් පැවති මෙම වරප්‍රසාදය පිළිබඳව මතු වූ ගැටළුව ගරු කථානායකවරයාගේ මැදිහත් වීම මත මුදල් අමාත්‍යවරයා මඟින් මුදල් අමාත්‍යාංශය වෙතද යොමු කරන ලදී. කෙසේ වුවද, මෙම ගැටළුව නිරාකරණය කිරීමට විසඳුමක් ලෙස මේ වනවිට පාර්ලිමේන්තුවේ කාර්යය මණ්ඩලය 6/2006 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකුට (බලපත්‍රය හිමි තනතුරට අදාල සක්‍රීය සේවා කාලය මාස 02 ත් වර්ෂ 01 ත් අතර) සහනදායී මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම" සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුව ස්ථානගත කිරීම පිණිස උපදේශකවරයෙකුගේ සහාය ඇතිව යෝජනාවලියක් සකසා ඒ සඳහා අදාළ අනුමැතියට යොමු කිරීමට සැලසුම්කොට ඇත. | |

**4. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ කාර්ය මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 994 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ, තෘතීය, ද්විතීය හා ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු පිළිවෙලින් 12 ක් 36 ක් 52 ක් හා 55 ක් ලෙස 155 ක් විය. | නිරීක්ෂණය පිළිගෙන ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |